# 08 ශ්‍රේණිය - සිංහල

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-03

## (2020- නව නිර්දේශය)




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


(විවිධ පළාත් සහ පාසල් මගින් තෙවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 05ක් සහ පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# Sinhala 3rd term Online Class Paper No - 01

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION

| ශ්‍රේණිය |
| --- |
| 08 |

**අවසාන වාර පරීක්ෂණය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II**

පාසලේ නම : ..................................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය : පැය 02 යි.

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත්ම සමීප අර්ථය දෙන පදය තෝරන්න.**

01. වැහි පොද වැටෙද්දී අම්මා ලහිලහියේ නිවසට පැමිණියා ය.

1. ඉතා ඉක්මනින්
2. ඉතා සෙමෙන්
3. අලසව
4. ලණුවක් රැගෙන

02. කවීක තරගයේ ප්‍රතිඵල ඇසූ නිමල්ගේ ඉහේ මලක් පිපුණි.

1. හිසේ මල් පිපීම
2. දැඩි සතුටක් ඇතිවීම
3. වේදනාවක් ඇතිවීම
4. පුදුමයක් ඇතිවීම

03. සඤ්ඤක අක්ෂරයක් යෙදී ඇති වරණය වන්නේ,

1. කළය
2. ප්‍රතිඵල
3. සුවඳ
4. ප්‍රෞඪ

04. අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. වීරෝදාර
2. කණිෂ්ඨ
3. පරිගණකය
4. කෘත්‍රිම

05. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය වන්නේ,

1. ඇතා,ගවයා, අශ්වයා,නරියා
2. කතරගම,කෑගල්ල ,කුරුණෑගල ,කොළඹ
3. ගයන්ත, ගනිදු, ගවේශ, ගරුක
4. රඹුටන්, අනෝදා,ජම්බු,ඇපල්

- **ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ ,**

06. නොසෑහෙන අශිෂ්ට බස් නොදොඩව වනචරය ,

1. ප්‍රයෝජ්‍ය ක්‍රියා
2. මිශ්‍ර ක්‍රියා
3. පූර්ව ක්‍රියා
4. විධි ක්‍රියා

07. පියසේන වටපිට බලමින් වීථියෙහි වේදිකාව දිගේ ගමන් කළේ ය.

1. මිශ්‍ර ක්‍රියා
2. අසම්භාව්‍ය ක්‍රියා
3. ආශීර්වාද ක්‍රියා
4. පූර්ව ක්‍රියා

- **මුලින් දී ඇති පදයට බහ්වර්ථ පදයක් නොවන්නේ ,**

08. තුරු

1. තරු
2. තූර්ය
3. ගස්
4. අක්ෂි

09. නා

1. ඇතා
2. නරියා
3. නාගයා
4. නායකයා

10. මුලින් දී ඇති පදයට සමානාර්ථයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. තොල්-ලවන්
2. අරවින්ද-සියපත
3. ශ්වේත-ස්වර්ණ
4. අනවරත-නිරන්තර

11. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් ඇතුළත්වන පදය වන්නේ ,

1. භාග්‍ය-වාසනාව   2. මෘදු-රළු   3. සතුට-සොම්නස   4. අකුසල්-පව්

12. අපි නිරතුරුව ම සුදන ඇසුරට යොමුවෙමු. මෙහි ඉරි ඇඳි පදය,

1. නිපාතයකි   2. උපසර්ගයකි
3. උපමාවකි   4. ක්‍රියා පදයකි

13. අනුක්ත සර්ව නාම පදයක් වන්නේ,

1. මම   2. තොප   3. අපි   4. ඔවුහු

14. ''දික් දිගට කොළ ඇති- කන්නන්ට රස ඇති දෙන්නන්ට අකමැති'' යන තේරවිල්ලෙන් කියවෙන්නේ,

1. උණ   2. උක්   3. අඹ   4. රඹුටන්

15. A. තද්ධිත නාම - E. හතළිස් අට

B. සමාස නාම - F. ගුරුදෙගුරු

C. අනුමානය - G. හේතු අනුව යමක් සිතා ගැනීම

D. අටසාළිස් - H. බුද්ධිමත්

නිවැරදි ලෙස අක්ෂර ගළපා ඇති වරණය වන්නේ,

1. A , E සහ B , F   2. B , F සහ C, G
3. D ,H සහ A, E   4. B , F සහ D, H

- **පහත දක්වා ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

16. ____________________ මිහිරි ලෙස ගීයක් ගායනා කළා ය.

1. ගායිකාවක   2. ගායිකාවක්   3. ගායිකාවන්   4. ගායිකාවෝ

17. වැද්දා _____________ පසුපස ලුහුබැන්දේ ය.

1. මුවෙක්   2. මුවෝ   3. මුවෙකු   4. මුවදෙනක්

- **හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

18. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ ස්ථානෝචිත ප්‍රඥා ඇතිව__________ප්‍රතිවාදීන්ට මුහුණ දුන් හ.

1. අවකිතව   2. ආරක්ෂාවෙන්
3. ගවේෂණයෙන්   4. නිරීක්ෂණයෙන්

19. "තම තරම දැන ගෙන- නොපැවතුණ හොත් සැම තැන

මීයාට වූ මෙන - බියයි වන්නේ නොසිතූ විලසින"

මෙම කවිය ඇතුළත් වන්නේ.

1. බුදු ගුණ අලංකාරයේ   2. ශික්ෂා මාර්ගයේ
3. පරාස්ස නාට්‍යයේ   4. දහම්ගැට මාලාවේ

20. "මනමේ'' නාට්‍ය රචනා කරන ලද්දේ,

1. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
2. හෙන්රි ජයසේන මහතා
3. රෝහණ බැද්දගේ මහතා
4. රෝහණ දන්දෙණිය මහතා

( ලකුණු 2 x 20 = 40 )

# II කොටස

1. පහත මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. රකිමු අපි පරිසරය. අප රකියි පරිසරය.
ii. රූපවාහිනිය සහ ළමා පරපුර
iii. පොදු දේපළ සුරැකීම අපේ යුතුකමකි.
iv. ගුරුවරු අපගේ දෙවිවරු ය.

(ලකුණු 20 යි)

2. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මට දැන් ඉස්කෝලේ ගිහින් මගේ යහළුවන්ටත් ඒ දේවල් කියාදෙන්න පුළුවන්.
අ) ඉහත පාඨය උපුටාගත් පාඩමේ නම ලියන්න.
ආ) මෙසේ ප්‍රකාශ කළේ කවරෙක් ද?
ඇ) මෙසේ කීවේ කා හට ද?

ii. " මේක නම් හරි ඇබැද්දියක් හාමුදුරුවනේ "
අ) ඉහත පාඨය උපුටාගෙන ඇති කෙටිකතාවේ නම කුමක් ද?
ආ) එහි රචකයා නම් කරන්න.
ඇ) මෙහි ' හාමුදුරුවනේ ' යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන්නේ කා හට ද ?

iii. "තමුන්නාන්සේ ඇයි මොකද මේ වෙවුලනව නේද?"
අ) ඉහත ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
ආ) මේ හා බැඳි අවස්ථාව ලියන්න.
ඇ) ඉහත පාඨය හා සම්බන්ධ මුල් කෘතියෙහි කතුවරයා නම් කරන්න.

iv. කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් ඇඩි වෙයි ගිනි සේ
ඇඳින එපව් දුරලන උපදේසේ
.................................................................................

අ) ඉහත කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
ආ) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය සඳහන් කරන්න.
ඇ) මෙහි සඳහන් "මී සේ " යන්නෙහි අර්ථය කුමක් ද?

v. "වළං කටු කැලි ගොඩක් තියෙනවා වගේ පේනවා"
අ) ඉහත ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම ලියන්න.
ආ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?
ඇ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් සමඟ ද?

(ලකුණු 3 x 5 = 15 යි)

3. පහත දැක්වෙන පද්‍ය කොටස ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අඹර පියඹා යන සියොත් පෙළ
දියඹ පීනා යනෙන මින් රැළ
නෙක් රුවින් නෙක් වනින්
බෙදී ගිය විලසා

බෙදෙනු කිම එක මිහි මවකගේ
කුස උපත ලද මිනිසා

i. මෙහි එන " අඹර පියඹා යන සියොත් පෙළ " යන්නෙහි අර්ථය ලියන්න.
ii. මෙහි සඳහන් සමූහාර්ථවාචී පද දෙකක් ලියා දක්වන්න.
iii. මුහුදේ ගැඹුරු ස්ථානය යන අදහස දෙන වචනය ඇතුළත් කවි පදය උපුටා දක්වන්න.
iv. විවිධ ' වර්ණයෙන් ' යන්නට සමාන වචන යුග්මය පැදි පෙළින් තෝරා ලියන්න.
v. මෙම පද්‍යයෙන් රචකයා සමාජයට දෙනු ලබන පණිවිඩය කුමක් ද?

(ලකුණු 2 x 5 = 10 යි)

4. ඔබ ඔබගේ ගම් ප්‍රදේශයට අයත් යොවුන් සමාජයේ ලේකම් යැයි සිතා එහි මූලිකත්වයෙන් සිදුකෙරෙන "මත් උවදුර පිටුදැකීම" පිළිබඳ වැඩසටහනට සමගාමීව ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීමට ආරාධනා කරමින් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.

නැතහොත්

ඔබ ප්‍රදේශයේ ඇති ක්‍රීඩා සමාජයක සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසු ජීව දත්ත පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(ලකුණු 15 යි)

# Sinhala 3rd term Online Class Paper No - 01

**පිළිතුරු පත්‍රය (8 ශ්‍රේණිය)**

**සිංහල භාෂා හා සාහිත්‍යය**

## I කොටස

| ප්‍රශ්න අංක | පිළිතුරු අංක | ප්‍රශ්න අංක | පිළිතුරු අංක |
|---|---|---|---|
| 1) | i | 2) | ii |
| 3) | iii | 4) | ii |
| 5) | ii | 6) | iv |
| 7) | i | 8) | iv |
| 9) | ii | 10) | iii |
| 11) | ii | 12) | ii |
| 13) | ii | 14) | ii |
| 15) | ii | 16) | ii |
| 17) | iii | 18) | i |
| 19) | ii | 20) | i |

## II කොටස

2)

i. අ) අලුත් අවුරුදු උත්සවය

ආ) පුතා

ඇ) තාත්තාට

ii. අ) පෙත්සමා

ආ) ලීලි ගුණසේකර

ඇ) ඒජාන්ත උන්නාංසේ

iii. අ) පූර්ණක විසින්

ආ) පුංචිරාල / ගමරාලගේ ගෙදරට යන

අවස්ථාවේ (පූර්ණක සහ කාළහීෂණ)

ඇ) ඒ.පී. ගුණරත්න මහතා

iv. අ) නුදුන මැනවි තුන්දොර අවකාසේ

ආ) ලෝවැඩ සඟරාව

ඇ) මී පැණි වගේ

v. අ) සයුරු ගැබෙන් මතු වූ නැව

ආ) තරුණ කිමිදුම්කරුවා

ඇ) පුරා වි. දෙපාර්තුමේන්තුවේ ස්ථාන

භාර නිලධාරියා

3)

i. අහසෙහි පියඹා යන කුරුලු රංචු

ii. පෙළ , රැළ

iii. දියඹ පීනා යනෙන මින් රැළ

iv. නෙක් වනින්

v. මිනිසුන් ජාති ආගම් වශයෙන් නොබෙදී

එක් මවකගේ දරුවන් ලෙස සිටිය යුතු බව

(මේ හා සමාන පිළිතුරු)

# Grade 8 Sinhala 3rd term Online Paper No - 02

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION

ශ්‍රේණිය 08

අවසාන වාර පරීක්ෂණය
සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : .................................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය : පැය 02 යි.

## I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. වර්තමාන සිංහල වර්ණ මාලාවේ ඇති අක්ෂර ගණන

   1. 50 කි  2. 70 කි  3. 54 කි  4. 60 කි

2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

   1. භීෂනය  2. ගෝලීයකරණය  3. අක්ශරය  4. නිශ්පාදනය

3. නිවැරදි අකාරාදී පිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.

   1. ජනවාරි , පෙබරවාරි , මාර්තු , අප්‍රේල්
   2. අප්‍රේල් , මාර්තු , පෙබරවාරි , ජනවාරි
   3. අප්‍රේල් , ජනවාරි , පෙබරවාරි , මාර්තු
   4. මාර්තු , අප්‍රේල් , පෙබරවාරි , ජනවාරි

4. විධි ක්‍රියා පදයක් යෙදී නැති වරණය තෝරන්න.
   1. එන්න මද නලේ ගොස් පවසන්න දුක මගේ
   2. ගොඩැල්ලේ තරම දැන ගෙන ළිඳ කපනු
   3. දණ ගාද්දී ඇවිදින්නට මට අත දුන්න
   4. බලවු පොළොන්නරු අනුරාපුර පෙදෙස

5. පහත සඳහන් පද අතුරෙන් තද්ධිත පදයක් නොවන්නේ ,

   1. ලෝහමය  2. ශිෂ්‍යත්ව  3. සාමාජික  4. ඉන්දියාව

6. "ගුරුතුමිය මට ආදරයෙන් කථා කළා ය." ඉහත වැකියෙහි ක්‍රියා විශේෂණ පදය වන්නේ ,

   1. මට  2. ගුරුතුමිය  3. ආදරයෙන්  4. කළා ය.

7. "නැමෙන් පසු නංගී ඇඳ සිටියේ ලස්සන ගවුමකි " මෙම වැකියෙහි නාම විශේෂණ පදය

   1. නැමෙන්  2. නංගී  3. ලස්සන  4. ගවුමකි

8. "තුරු" යන බහුවර්ථ පදයෙහි තේරුමක් නොවන්නේ,

   1. ගස්  2. තුරග  3. තරු  4. තෙක්

9. සමානාර්ථ පදයක් සහිත වරණය තෝරන්න.

   1. කුසුම් - නෙළුම්  2. නුවණ - ඇස  3. ඕලු - ඇඹුල  4. අරවින්ද - මානෙල්

10. අනියමාර්ථ උක්ත නාම පදයක් වන්නේ ,

    1. මිනිසෙකු  2. ගැහැනියක  3. කෙනෙකු  4. අයෙක්

11. විරුද්ධාර්ථ පදයක් සහිත වරණය තෝරන්න.

1. අවුල්-වියවුල් 2. දුක්-දොම්නස් 3. කෙලෙස්-නිකෙලෙස් 4.සැප-සනීප

12. විරාම ලක්ෂණ නිවැරදි ව භාවිතා කර ඇති වරණය තෝරන්න

1. අනේ ! ගමහාමුදුරුවනේ , මාව මරන්ඩ එපා.
2. අනේ , ගමහාමුදුරුවනේ මාව මරන්ඩ එපා .
3. අනේ , ගමහාමුදුරුවනේ මාව මරන්ඩ එපා ?
4. අනේ ! ගමහාමුදුරුවනේ මාව මරන්ඩ එපා ,

13. නිවැරදි ව පද බෙදා ඇති වරණය තෝරන්න.

1. නවදහස් පන්සිය හැත්තෑපහ
2. නවදහස් පන්සිය හැත්තෑ පහ
3. නවදහස් පන් සිය හැත්තෑ පහ
4. නව දහස් පන් සිය හැත්තෑපහ

14. "දැවයෙන් කරන ලද" යන්න සඳහා යෙදිය හැකි තනි පදයක් නොවන්නේ,

1. දාරුමය 2. දාරුවීරිය 3. දැවමය 4. දාරුමුවා

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

15. .................................................. දරුවන් හදා වඩා ගනිති.

1. දෙමාපියන් 2. මව 3. දෙමාපියෝ 4. පියා

16. රියදුරා නොසැලකිලිමත් ලෙස රිය .......................................

1. පැදවූවාය 2. පැදවීය 3. පැදවූහ 4. පදවන්නීය

17. විදුහල්පතිතුමා ............................. අමතා කථා කළේ ය.

1. ශිෂ්‍යයන්
2. සිසුහු
3. ශිෂ්‍යයෝ
4. ශිෂ්‍ය - ශිෂ්‍යාවෝ

18. පහත සඳහන් ප්‍රස්තාව පිරුළෙහි හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

සුබ නම් දොරටු පලයාට ................................ පැලැන්දුවා වාගේ

1. මාල 2. සේල 3. ඔටුනු 4. තෝඩු

19. "පරාස්ස" නාට්‍ය රචනා කළේ ,

1. රෝහණ දන්දෙනිය මහතා ය.
2. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.
3. හාන්ස් ක්‍රිෂ්ටියන් මහතා ය.
4. මහගමසේකර මහතා ය.

20. ගුණදාස අමරසේකර විසින් රචනා කරන ලද නවකතාවක් නොවන්නේ,

1. යළි උපන්නෙමි.
2. දෙපා නොලද්දෝ
3. රන් කැකිර හා තවත් කතා
4. ගමනක මුල

(ලකුණු 40)

# II කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.

   i. පොතපත කියවා දැනුම ලබමු.
   ii. අපේ පරිසරය පණ මෙන් සුරකිමු.
   iii. පරිගණකය අධ්‍යාපනය සඳහා යොදා ගනිමු.
   iv. මත්ද්‍රව්‍ය උවදුර දුරලමු.

(ලකුණු 20 යි)

2. පහත සඳහන් ගද්‍ය පාඨ (අ) අඩංගු පාඩමේ නම (ආ) කවුරු විසින් (ඉ) කාහට පවසන ලද්දක් ද යනවග ලියා දක්වන්න.

   i. " ඉතිං අපි කරන්නේ විවාදයක් නො වැ "
   ii. " මං හිතුව කීරාලලගේ දිහා පැළ වුණා කියල "
   iii. " පුංචි දැරිය , ඔබ අපට ඇය සිටින තැනක් පෙන්වන්න "
   iv. " අපේ අම්මට මොකවත් වුණොතින් දන්නව ද ? "
   v. " අද නැවා ම ආයෙ නාන්න තියෙන්නේ තව දවස් දෙකින් "

(ලකුණු 15 යි)

3. පහත සඳහන් ගද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නූතන යුගයේ මුල් වකවානුවට අයත් කවීන් අතර ජාත්‍යාලය හා ජාතිකාභිමානය ඔප නැංවීමෙහි ලා මහත් මෙහෙවරක් ඉටු කළා වූ කවියෙකු ලෙස සැලකෙන එස්. මහින්ද හිමියෝ ජාතික ආගමික පුනර්ජීවන ව්‍යාපාරයෙ හි පුරෝගාමී චරිතයක් වූහ.

ළමා පරපුර කේන්ද්‍ර කර ගනිමින් නිදහස් හා නිවහල් චින්තනයක් ළමා මනස්හි ජනිත කරවමින් ජාත්‍යාලය වර්ධනයෙහි ලා තම කවි ශක්තිය මෙහෙය වූ මහින්ද හිමියෝ කව්මුතු , කව්මිණි , ළමා කවි කළඹ වැනි පොත් ද දරු නැලවිල්ල හෙවත් ජාතික තොටිල්ල , නිදහසේ මන්ත්‍රය , නිදහසේ දෑහැන , ලංකා මාතා වැනි ග්‍රන්ථ ද රචනා කළ හ.

කාලීන අවශ්‍යතා උදෙසා කවිය මෙහෙය වූ කොළඹ යුගයේ මුල් පරපුරේ බොහෝ කවීන් මෙන් ම උද්වේගකර වූ ඍජු බවක් හා ආවේගශීලීත්වයක් මහින්ද හිමියන්ගේ නිර්මාණ වෙතින් ද ප්‍රකට වුව ද ඉතා සූක්ෂම වූ නිසග කවිත්වයක් ළමා පරපුර උදෙසා එහිමියන් නිර්මාණය කළ ඇතැම් පද්‍යවලින් පිළිබිඹු වනුයේ භාෂා භාවිතයේ අපූර්වත්වය ද ප්‍රකට කරමිනි. ජාත්‍යාලය වඩවනු වස් විශාල සමාජ වගකීමක් තමන් වෙත පවරා ගනිමින් කාව්‍යකරණයෙහි යෙදුණු උන්වහන්සේ තමන් විසූ යුගය තම කවිවල නිරූපණය කරමින් කාව්‍යකරණයෙහි නිමග්න වූවෙකු ලෙස සැලකිය හැක ය.

   i. මහින්ද හිමියන් අයත් කවි පරපුර කුමක් ද?
   ii. මහින්ද හිමියන් තම කවි ශක්තිය මෙහෙය වූයේ කවුරුන් කේන්ද්‍ර කර ගනිමින් ද?
   iii. මහින්ද හිමියන් විසින් රචනා කළ කාව්‍ය ග්‍රන්ථ 2ක් නම් කරන්න.
   iv. මහින්ද හිමියන්ගේ නිර්මාණවලින් වඩාත් ප්‍රකට වන ලක්ෂණ 2ක් ලියන්න.
   v. පහත සඳහන් වචන 2 හි අර්ථය පැහැදිලි කරන්න.
      (අ) ජාත්‍යාලය
      (ආ) ජාතිකාභිමානය

(ලකුණු 10 යි)

4. ඔබේ පාසලේ අලුතින් ඉදිකරන ලද පුස්තකාලයට අවශ්‍ය ළමා පොත් ලබා දෙන ලෙස ඉල්ලා පළාත් අධ්‍යාපන අමාත්‍යතුමා වෙත යැවෙන රාජකාරී ලිපිය ලියන්න. ( ඔබ පාසල් පුස්තකාල සංගමයේ ලේකම් යැයි සිතන්න )

නැතහොත්

රත්මල්යාය ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලය මඟින් නොමිලේ සංවිධානය කරනු ලබන වෛද්‍ය සායනයට සහභාගී වන ලෙස ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න. ( ඔබ ප්‍රාදේශීය සෞඛ්‍ය නිලධාරියා යැයි සිතන්න.)

(ලකුණු 15 යි)

# Grade 8 Sinhala 3rd term Online Paper No - 02

සිංහල භාෂාව හා සාහිත්‍යය

අවසාන වාර පරීක්ෂණය -8 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

1 කොටස

| අංකය | පිළිතුර අංකය |
|---|---|
| 1 | iv |
| 2 | ii |
| 3 | iii |
| 4 | iii |
| 5 | iv |
| 6 | iii |
| 7 | iii |
| 8 | ii |
| 9 | iii |
| 10 | iv |
| 11 | iii |
| 12 | i |
| 13 | i |
| 14 | ii |
| 15 | iii |
| 16 | ii |
| 17 | i |
| 18 | iii |
| 19 | i |
| 20 | iii |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

**2.i. (අ)** පොදු පුනරුදයේ සෙන්පතියාණෝ

**(ආ)** මොහොට්ටිවත්තේගුණානන්ද හිමි විසින්

**(ඉ)** දායක මහතෙකුට

**ii. (අ)** පරාඝ්ස නාට්‍ය

**(ආ)** පුරංසිනා විසින්

**(ඉ)** පුංචිරාලට

**iii. (අ)** සැබෑ ලෙන්ගතුකම

**(ආ)** යුව රජු ඇතුළු රාජ සභාව විසින්

**(ඉ)** මාලිගාවේ මුළුතැන් ගෙයි සිටින මෙහෙකාර දැරියට

**iv. (අ)** අවුරුදු සිහිනය

(ආ) පියසේන විසින්

**(ඉ)** කුස්සියේ වැඩ කරන ගැහැණියට **(**කුස්සි අම්මාට**)**

**v. (අ)** අලුත් අවුරුදු උත්සවය

**(ආ)**සීයා විසින්

**(ඉ)** මුණුබුරාට (ලකුණු 3 × 15 = 15)

3). i. නූතන යුගයේ මුල් පරපුර

ii. ළමා පරපුර

iii. ජාතික තොටිල්ල / නිදහසේ මන්ත්‍රය/නිදහසේ දැහැන/ලංකා මාතා/කව්මුතු/කව්මිණි /ළමා කවි කළඹ

iv. ඍජු බවත් / ආවේගශීලීත්වයත් /සූක්ෂම වූ නිසඟ කවිත්වයත් භාෂා භාවිතයේ අපූර්වත්වයත්

v.(අ) ජාතිය පිළිබඳ ඇති ආලය

(ආ) ජාතිය පිළිබඳ ඇති අභිමානය (ලකුණු 2 × 5 = 10)

4) . ප්‍රායෝගික ලේඛනය

| | | | |
|---|---|---|---|
| 1.ආකෘතිය | ලකුණු | 05 | |
| 2.අන්තර්ගතය | ලකුණු | 08 | |
| 3.ශිල්පීය දක්ෂතා | ලකුණු | 02 | (ලකුණු 15) |

# Grade 8 Sinhala 3rd term Online Paper No - 03

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION

| ශ්‍රේණිය |
|---|
| 08 |

**අවසාන වාර පරීක්ෂණය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II**

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි.

**I කොටස**

- **ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **1,2 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අර්ථය දෙන යෙදුම තෝරන්න.**

01. සිරියාවතී තම නැන්දම්මා සමඟ කටයුතු කළේ කැත්තට පොල්ල මෙනි.
    1. වැරදි අවබෝධයකිනි.
    2. එකට එක කිරීමෙනි.
    3. ඉතා සෙනෙහසිනි.
    4. ඉතා තරහකිනි.

02. සියාතු මාමාට අමු කැවිලා දුයි වෙද මාමා තරහෙන් ඇසුවේ ය.
    1. අමු ආහාර කැවී
    2. වැරදි අවබෝධයක්
    3. නිවැරදි අවබෝධයක්
    4. පෝෂ්‍යදායී ආහාරයක් ලැබී

- අංක 3-4 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

03. තම රට පිළිබඳ ඇති සාඩම්බර හැඟීම ______________ යනුවෙන් හැඳින්විය හැකි ය.
    1. දේශාභිමානය
    2. දේශීයත්වය
    3. දේශමාමකත්වය
    4. දේශවාත්සල්‍යය

04. "පරාස්ස" නාට්‍යයේ රචකයා වන්නේ,
    1. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.
    2. දයානන්ද ගුණවර්ධන මහතා ය.
    3. රෝහණ බැද්දගේ මහතා ය.
    4. රෝහණ දන්දෙණිය මහතා ය.

05. නිවැරදි අකාරාදී පිළිවෙළ දක්වෙන වරණය තෝරන්න.
    1. දුරුතු , නවම් , බක් , මැදින්
    2. දුරුතු , නවම් , මැදින් , බක්
    3. නවම් , බක් , මැදින් , දුරුතු
    4. මැදින් , බක් , නවම් , දුරුතු

06. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
    1. පරිගනකය
    2. කළමණාකරණය
    3. නවීකරණය
    4. නිශ්පාදනය

07. මහප්‍රාණ අක්ෂරයක් නො යෙදුණ වචනයක් වන්නේ,
    1. පිළිවෙළ
    2. ප්‍රතිඵල
    3. වර්ධනය
    4. පණ්ඩුකාභය

08. සමානාර්ථය දෙන යුගල පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
    1. ඇත - මැත
    2. සෙරෙප්පු - බෙරෙප්පු
    3. අනම් - මනම්
    4. සුව - පහසු

09. විධි ක්‍රියාවක් යෙදී ඇති වරණය තෝරන්න.
    1. නංගී උඩ පැන පැන නැටුවා ය.
    2. ගොඩැල්ලේ තරම දැන ගෙන ළිඳ කපනු
    3. ළමයා දත් මැද , මුහුණ සේදුවේ ය.
    4. දණ ගාද්දී ඇවිදින්නට මට අත දුන්න

10. සමානාර්ථයක් නො දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
1. අවුරුද්ද , වසර , වර්ෂය
2. නුවන , නයන , නේත්‍ර
3. අහස , ගුවන , දෙරණ
4. කුසුම් , මල් , පුෂ්ප

11. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
1. සුදන-දුදන
2. උත්තම-අත්තම
3. අය-වැය
4. ආධුනික-ප්‍රවීණ

12. කතරගම යනු, ශ්‍රී ලංකාවේ ඓතිහාසික වශයෙන් වැදගත් නගරයකි. මෙහි ඉරි ඇඳි පදය,
1. සංඥා නාමයකි
2. ගුණ නාමයකි
3. ජාති නාමයකි
4. ද්‍රව්‍ය නාමයකි

13. පහත සඳහන් පදවලින් ක්‍රියා විශේෂණ පදයක් නොවන්නේ,
1. වේගයෙන්
2. හෙමින්
3. කෝපයෙන්
4. දුවමින්

14. උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය වන්නේ,
1. මිනිසෙකු , ඇතෙකු
2. මිනිසෙක් , ඇතෙක්
3. ගැහැනියක් , ශිෂ්‍යාවක
4. මිතුරෙකු , ගවයෙක්

15. 'දිය ගොඩ දෙකෙහි වසන' යන අදහසට ගැළපෙන තනි පදය වන්නේ,
1. වනජීවී
2. උභයජීවී
3. ජල ජීවී
4. සජීවී

16. නිවැරදිව පද බෙදී ඇති වරණය තෝරන්න.
1. විදුහල් පතිතුමිය ශිෂ්‍යාවන් අමතන්නී ය.
2. විදුහල්පති තුමිය ශිෂ්‍යාවන් අමතන්නී ය.
3. විදුහල්පතිතුමිය ශිෂ්‍යාවන් අමතන්නී ය.
4. විදුහල්පතිතුමිය ශිෂ්‍යා වන් අමතන්නී ය.

17. දී ඇති ප්‍රස්තාව පිරුළට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.
- දී කිරට බළල්ලුන් සාක්කිලු -
1. වාසි පැත්තට කවුරුත් කැමති වීම.
2. වාසි - අවාසි දෙපැත්තට ම කැමති වීම.
3. අවාසි පැත්තට කවුරුත් කැමති වීම.
4. වාසි පැත්තට කවුරුත් අකැමති වීම.

- ප්‍රශ්න අංක 18,19,20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

18. මුවෝ ________________ රකිති.
1. පැටවු
2. පැටවුන්
3. පැටියෙක්
4. පැටියෝ

19. _____________ බඩු විකුණති.
1. වෙළෙන්දෝ
2. වෙළෙන්දා
3. වෙළෙන්දෙක්
4. වෙළෙන්දන්

20. ගංගාවෝ ගලා ______________.
1. බසියි.
2. බසින්නේ ය
3. බසිති.
4. බැස්සේ ය

(ලකුණු 2 × 20 = 40)

## I I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

02. පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150 ට නො අඩු රචනාවක් ලියන්න.

i. පරිසරය පණ මෙන් සුරකිමු.
ii. රිය අනතුරු වළකමු.
iii. වැඩිහිටියන් සුරකිමු.
iv. අසිරිමත් මගේ රට ශ්‍රී ලංකාවයි.

(ලකුණු 20 )

03. පහත ප්‍රකාශයන් කළේ කවු ද? කාට ද? කුමන අවස්ථාවක දැයි ලියා දක්වන්න.

i. "මේක කාටත් ප්‍රයෝජනවත් වෙන දෙයක් හරි ද?"
ii. "අද නැවා ම ආයේ නාන්න තියෙන්නේ දවස් දෙකකින්"
iii. "කෝ මෙහාට ඇවිල්ලා මේ කතුර නෝන මහත්මයට ගිහින් දීපන් "
iv. "ඔබ දැනටමත් මට ප්‍රත්‍යුපකාර කර අවසන් "
v. "මං හිතුවා කීරාලලගේ දිහා පැළ වුණා කියලා"

(ලකුණු 3 × 5 = 15)

04. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

මිනිස් සමාජයේ ආරම්භයේ සිට ම මිනිස් අවශ්‍යතා අතර එක් අංගයක් වශයෙන් සන්නිවේදනය පැවති බව පිළිගත හැකි ය. වචන, රූප සටහන් , චිත්‍ර , විවිධ හඬ , හස්ත , මුද්‍රා ආදිය මඟින් ඇරඹි සන්නිවේදනය විවිධ මාධ්‍ය ඔස්සේ වර්ධනය වන්නට වූයේ සමාජයේ සංවර්ධනයත් සමඟිනි. පුරාණ රජදරුවන් සෙල්ලිපි මඟින් සිදු කළ ලිඛිත සන්නිවේදනයත් , පන් හිදෙන් තල්පත මත ලියැ වී ඇරඹි ලේඛන කලාවත් , පක්ෂීන් මඟින් හා අන් ක්‍රමවලින් සන්නිවේදනය වූ පණිවුඩ හුවමාරුව තැපැල් සේවය ආරම්භ වීම දක්වා වර්ධනය වීමත් සන්නිවේදන ක්ෂේත්‍රයේ පරිවර්තන ලෙස හැඳින්විය හැකි ය. දහ නවවන සියවසේ මුල් භාගය වන විට පුවත්පත් හා තැපැල් සේවය පමණක් ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය බවට පත් ව තිබුණි.

i. සන්නිවේදනය ආරම්භ වූයේ කුමන දෑ මඟින් ද?
ii. පුරාණයේ දී ලිඛිත සන්නිවේදනය සිදු වූයේ කුමකින් ද?
iii. පුරාණයේ දී භාවිත කළ සන්නිවේදන ක්‍රමයක් නම් කරන්න.
iv. 19 වන සියවසේ තිබූ ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය දෙක නම් කරන්න.
v. මෙහි සඳහන් ජාති නාම පද දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 10 )

05. වත්මන් සමාජයේ මහත් ගැටලුවක් ව පවතින පොලිතින් භාවිතයෙන් වන හානිය හා පොලිතින් වෙනුවට භාවිත කළ හැකි විකල්ප පිළිබඳ අවධානය යොමු කරමින් "පොලිතින් රකුසා පළවා හරිමු" යන මාතෘකාව යටතේ ප්‍රජාව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

**නැතහොත්,**

පවුල් 50 ක් පමණ ජීවත් වන ඔබේ ග්‍රාමය සඳහා තවමත් පානීය ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වී නොමැති නිසා එහි වෙසෙන ජනයා විවිධ දුෂ්කරතාවලට ලක් ව ඇති බැවින් ඒ පිළිබඳ දැනුවත් කරමින් ඔබගේ ග්‍රාමයට ජල ව්‍යාපෘතියක් ලබා දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා වෙත යැවෙන රාජකාරි ලිපිය ලියන්න. ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.

(ලකුණු 15 )

# Grade 8 Sinhala 3rd term Online Paper No - 03

## සිංහල භාෂාව හා සාහිත්‍යය ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1 | 2 |
| 2 | 2 |
| 3 | 1 |
| 4 | 4 |
| 5 | 1 |
| 6 | 3 |
| 7 | 1 |
| 8 | 4 |
| 9 | 2 |
| 10 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 11 | 2 |
| 12 | 1 |
| 13 | 4 |
| 14 | 2 |
| 15 | 2 |
| 16 | 3 |
| 17 | 1 |
| 18 | 2 |
| 19 | 1 |
| 20 | 3 |

### II කොටස

03. I. එතනහාමි පාඩමේ සාත්තරකාරයා විසින් එතනහාමිට හා ඩිංගිරාලට නැති වූ හවරිය ගැන ඇසීමට ගිය අවස්ථාවේදී ය.

II. අලුත් අවුරුදු උත්සවය පාඩමේ සීයා විසින් තම මුණුබුරාට අවුරුදු චාරිත්‍ර කියා දෙන අවස්ථාවේදී ය.

III. අවුරුදු සිහිනය පාඩමේ කුස්සි අම්මා විසින් පියසේනට අම්මා ඒ දැයි උළුවස්සට හේත්තු වී පාර දෙස බලා සිටි අවස්ථාවේ දී ය.

IV. සැබෑ ළෙන්ගතුකම පාඩමේ අධිරාජයා විසින් පුංචි කිරිල්ලියට මරණාසන්න අවස්ථාවේ දී ස්තූති කරමින් සමාව ගන්නා අවස්ථාවේ දී ය.

V. පරාස්ස නාට්‍යයේ පුරංසිනා විසින් පුංචිරාලට කීරාලලාගේ නිවසට ගොස් පුංචිරාල පැමිණි අවස්ථාවේ දී ය.

04. I. වචන, රූප සටහන්, චිත්‍ර, විවිධ හඬ, හස්ත මුද්‍රා
II. සෙල්ලිපි මඟින්
III. පක්ෂීන් මඟින්
IV. පුවත්පත් හා තැපැල් සේවය
V. මිනිස්, පක්ෂීන්

# Grade 8 Sinhala 3rd term Online Paper No - 04

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**08 ශ්‍රේණිය** | **වර්ෂ අවසාන පරීක්ෂණය** | **21 S**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I හා II** | **කාලය පැය දෙකයි**

**නම / විභාග අංකය :**

- **අංක 01 සිට 03 දක්වා ඉරි ඇඳි පදයට සමාන අර්ථයක් ඇති පදය තෝරන්න.**

01) මවගෙන් ලිපියක් ලැබුනු සමනලීට එය <u>ඉහේ මලක් පිපුණාක්</u> මෙන් විය.
i. ලොතරැයියක් ඇදීම ii. විශාල ධනයක් ලැබීම iii. දැඩි දුකක් iv. දැඩි සතුටක් ලැබීම

02) නව විදුහල්පතිතුමා <u>අල්ලේ නැටවීමට</u> ඔවුන් දැරූ උත්සහය අසාර්ථක විය.
i. යටත් කර ගැනීමට ii. තමන් අනුව හැසිරීමට
iii. අවශ්‍ය පරිදි හැසිරීමට iv. යමකින් පාලනය කිරීමට

03) ඇතැම් මන්ත්‍රීවරු <u>දෙපිටකාට්ටු වැඩ</u> කරමින් අනුන් රවටති.
i. ඉතා හොඳින් වැඩ කරමින් ii. දෙපැත්තට ම හොඳින් වැඩ කරමින්
iii. දෙපැත්තම මුලා කරමින් iv. ඉතා සෙමින් වැඩ කරමින්

- **අංක 04 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා ගැළපෙන පිළිතුර තෝරන්න.**

04) ජනපතිතුමා මුළු පාර්ලිමේන්තුවම ............................... ( ඇමතීය. / ඇමතුහ. )

05) ............................ ( අලි රංචුව / අලියා ) ගම වනසති.

- **අංක 06 සිට 07 දක්වා මුලින් දී ඇති ක්‍රියාපද වර්ගයට අයත් නොවන පදය තෝරන්න.**

06) අසම්භාව්‍ය ක්‍රියා,
i. දුවතී ii. දුවද්දී iii. දුවත iv. දිව්වොත්

07) පූර්ව ක්‍රියා, පදය තෝරන්න.
i. කමින් ii. දිවේවා iii. ගොස් iv. බලමි

08) අකාරාදි පිළිවෙලට ඇති වරණය තෝරන්න.
i. සයවන, සායනය, සීමැදුර, හකුරු ii. ගායක, ගැහැනු, ජීවිතය, කවිය
iii. කවිය, කාවින්ද, පාවර, පවුර iv. තාලය, කාලය, මානය, ආරය

09) මුලින් දී ඇති පදයට සමාන පදය පිළිතුරු අතරින් තෝරන්න.
⋆ **වලාකුළ**
i. වැස්ස ii. නමුනුකුළ iii. ජලධර iv. ජලජ

10) විරුද්ධාර්ථ පදය තෝරන්න.
⋆ **දුගතිය**
i. මලිතිය ii. උන්නතිය iii. අවනතිය iv. සුගතිය

11) "පෑවුල" යන්නට සමීප අර්ථය වන්නේ,
i. පැරණි ii. අද්‍යතන iii. පුළුල් iv. චිරාගත

12) "දුබල" යන්නට විරුද්ධාර්ථ පදය වන්නේ,
i. ප්‍රබල ii. දුර්ලභ iii. දුර්මුඛ iv. උත්තම

13) "දද" යන පදයට බහු අර්ථ පදයක් නොවන්නේ,
i. කොඩිය ii. බමුණු iii. පැන iv. කුෂ්ඨ

14) මහාප්‍රාණ අක්ෂරය ඇතුළත් පදය තෝරන්න.
i. තෘණ ii. ප්‍රමාද iii දළ iv. ආභරණ

15) නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදූ පදය තෝරන්න.
i. සංඝායනාව ii. සංගායනාව iii. ශංගායනාව iv. සංගායණාව

**• 16 සිට 20 දක්වා හිස්තැනට ගැළපෙන පදය තෝරන්න.**

16) __________ උදෑසන අවදි වන්නීය.
i. තාත්තා ii. අම්මා iii. බල්ලා iv. මල්ලී

17) නුවර වැව බලන්නට නුඹ __________ .
i. යමි. ii. යන්නෙහු. iii. යති. iv. යන්නෙහි.

18) ජනපතිතුමිය __________ අමතා කතා කළාය.
i. මන්ත්‍රීවරු ii. ළමයි iii. අප iv. ගුරුවරු

19) __________ උදෑසන පාසලට පියමං කරති.
i. ළමයි ii. ගුරුවරුන් iii. ගුරුවරියන් iv. පාසල් මුරකරු

20) ගුරුවරු දරුවන් යහමග __________
i. යවයි. ii. යවති. iii. යවනු ලබයි. iv. යවන ලදහ.

**• 21 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

21) ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝපාපිල්ල, ඇදය, යංශය පිළිවෙලින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
i. මෘදු, රූප, රැළ, ව්‍යාංග ii. තෘණ, රැල්ල, රූල, ත්‍යාගය
iii. ත්‍යාගය, තෘතිය, නූල, ක්‍රමය iv. ගෞරවය, රෑන, පත්‍රය, බිල්ල

22) ක්‍රියා නාමයක් නොවන්නේ,
i. රකින ii. කියුම් iii. මැසිවිලි iv. රන්මුවා

23) තද්ධිත නාමයක් වන්නේ,
i. දේශීය ii. රවුම iii. කාලය iv. රට

24) ක්‍රියා විශේෂණයක් වන්නේ,
i. ඉගටි ii. බලවත් iii. කල්බඳ iv. වේගයෙන්

25) අම්මා උදෑසන <u>කිරිබත්</u> පිසුවාය. ඉරිඇඳි පදය වන්නේ,
i. තද්ධිත නාමයකි. ii. කෘදන්ත නාමයකි. iii. සමාස නාමයකි. iv. නාම නාමයකි.

26) "එතනහාමි" කතාව,
i. ජාතක කතාවකි ii. ජන කතාවකි iii. වීර කතාවකි iv. අන්තර්ජාල කතාවකි

27) අලුත් අවුරුදු උත්සවය යනු,
i. පාරම්පරික උත්සවයකි. ii. ආගමික උත්සවයකි.
ii. ජීවන සංක්‍රාන්තික උත්සවයකි. iv. සමාජයට අනුගතව සමරන උත්සවයකි.

28) "කිරි මෝරු" යනු,
i. කෑමකි. ii. පානයකි. iii. සතෙකි. iv. යන්ත්‍රයකි.

29) "රාත්‍රිය" කවි පෙළ රචනා කළේ,
i. ගුණදාස අමරසේකර මහතා ii. එස්. මහින්ද හිමි iii. මහගම සේකර මහතා iv. මකුළුලොලුව මහතා

30) "වහා තාගේ කඩුව හා දුනු හී බිම දමා මට නමස්කාර කරව", මෙය අඩංගු නාට්‍ය වන්නේ,
i. මනමේ නාට්‍යය ii. හුණුවටය නාට්‍යය iii. වෙස්සන්තර නාට්‍යය iv. ගුරු තරුව නාට්‍යය

(ල. 1x30 = 30)

## II කොටස

**• සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1.) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන <u>වචන 150 කට නොඅඩු</u> රචනාවක් ලියන්න.
1. ගහකොළ වවා පරිසරය සුරකිමු.
2. සමගි වී රට රකිමු.
3. මත් රකුසා එළවා දමමු.
4. ඇළදොළ රැකගෙන සැනසෙමු.
5. අපේ රටයි මහ මුහුදයි. ( ලකුණු 20 )

2.) පහත සඳහන් උද්ධෘතයන්ට අවස්ථා සම්බන්ධය දක්වන්න.
★ කිව්වේ කවුද?, කාටද?, පාඩම, සඳහන් කරන්න.

1. "තමුන්නාන්සේ ඇයි මොකද මේ වෙව්ලනවා නේද"
2. "මේ ලිතේ තියෙන නානු කියන්නේ මොනවාද?"
3. "ඉදා ඉක්මනට කඩේට ගිහිල්ලා නූල් රෝද දෙකක් අරගෙන වරෙන්"
4. "මට මාලිගාව සුදුසු තැනක් නෙවෙයි"
5. "මේක කාටත් පොරෝජන වෙන දෙයක් හරිද?" ( ලකුණු 3 x 5 = 15 )

3. පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ගොවියෝ අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

ගත රැඳි දුහුවිලි රනබරණයි
දහදිය මඩ විලවුන් සුවඳයි
රට වෙනුවෙන් ගත සිත වෙහෙසෙයි
සිත සතුටේ උල්පත එතැනයි

ගොවියෝ අපි කම්කරුවෝ
රට රකිනා ජනතාවෝ

1. මෙහි සඳහන් ප්‍රථම පුරුෂ බහු වචන නාම පදයක් උපුටා දක්වන්න.
2. මෙහි සඳහන් රූපක දෙකක් ලියන්න.
3. උත්තම පුරුෂ නාම පදයක් උපුටා දක්වන්න.
4. සතුටේ උල්පත ලෙස දකින්නේ කුමක් ද?
5. ශරීරය සඳහා යොදා ඇති වචනය කුමක් ද?

( ලකුණු 2 x 5 = 10 )

4.) ඔබ ප්‍රදේශයේ මේ දිනවල ශීඝ්‍රයෙන් පැතිරයන ඩෙංගු රෝගය නිසා ප්‍රදේශවාසීන් විශාල කරදරයකට පත්ව ඇත. මෙම රෝගය නිසා මරණ දෙකක් ද වාර්තා වන අතර රෝගීන් විශාල සංඛ්‍යාවක් ද වාර්තා වේ. මේ තත්වය වලක්වා ගැනීම සඳහා ප්‍රදේශවාසීන් දැනුවත් කරන ලෙස ඉල්ලා මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයා වෙත යවන ( P.H.I ) ලිපියක් ලියන්න. ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතන්න.

( ලකුණු 15 )

5.) පහත සඳහන් කවි දෙක සම්පූර්ණ කරන්න.

1. කොණ්ඩේ නැතිව නිතරම තෙල් ගගා යති
කන්නේ නැතිව සැමගෙන් වියදම් ගනිති
.........................................................................
.........................................................................

2. ගමක නමකි අට අකුරෙන් යෙදෙන්නේ
මෙලක තැනකි පද තුනකින් හැදෙන්නේ
.........................................................................
.........................................................................

( ලකුණු 10 )

# Grade 8 Sinhala 3rd term Online Paper No - 04

## තෙවන වාර පරීක්ෂණය
## සිංහල භාෂාව හා සාහිත්‍යය
08 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. 4 | 6. 1 | 11. 3 | 16. 2 | 21. 1 | 26. 2 |
| 2. 3 | 7. 3 | 12. 1 | 17. 4 | 22. 4 | 27. 4 |
| 3. 3 | 8. 1 | 13. 3 | 18. 3 | 23. 1 | 28. 2 |
| 4. ඇමතීය | 9. 3 | 14. 4 | 19. 1 | 24. 4 | 29. 2 |
| 5. අලි රංචුව | 10.4 | 15. 2 | 20. 2 | 25. 3 | 30. 1 |

II කොටස

1. අන්තර්ගතය, ඡේද බෙදීම, අක්ෂර වින්‍යාසය ආදිය සලකා සමස්තයක් ලෙස ලකුණු පිරිනමන්න.

2. 1. පූර්ණක විසින් - කාලහීෂණ හට , පරාස්ස පාඩම
   2. පුතා විසින් සීයාට, - අලුත් අවුරුදු උත්සවය පාඩම
   3. ස්වාමී දුව විසින් - පියසේනට - අවුරුදු සිහිනය පාඩම
   4. සිංදු කියන කිරිල්ලිය විසින් රජතුමා ඇතුළු පිරිසට, - සැබෑ ළෙන්ගතුකම පාඩම
   5. සාස්තරකරු හෝ කපුවා විසින් / එතනහාමිට හා ඩිංගිරාළට - එතනහාමි පාඩම

3. 1. කම්කරුවෝ/ ගොවියෝ / ජනතාවෝ
   2. ⋆ ගත රැඳි දුහුවිලි රනබරණයි
      ⋆ දහඩිය මඩ විලවුන් සුවඳයි
   3. අපි
   4. රට වෙනුවෙන් ගත සිත වෙහෙස වීම.
   5. ගත

4. සමස්තය සලකා ලකුණු ප්‍රදානය කරන්න. ( ආකෘතිය, අන්තර්ගතය, අක්ෂර වින්‍යාසය )

5. කොණ්ඩේ නැතිව නිතරම තෙල් ගගා යති
   කන්නේ නැතිව සැමගෙන් වියදම් ගනිති
   නො දුටු කෙනෙක් දුටුව ම සිත කැමති වෙති
   මෙතුන් පදේ තේරුවොතින් නුවණ ඇති

   ගමක නමකි අට අකුරෙන් යෙදෙන්නේ
   මෙලක තැනකි පද තුනකින් හැදෙන්නේ
   මුලට රජෙකි අග නිවසකි සඟුන්නේ
   කිමෙක මෙසකි කිව හැකි දැයි බලන්නේ

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

# Sinhala 3rd term Online Class Paper No - 05

## තෙවන වාර පරීක්ෂණය

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකය: |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 හා 02 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ලොකු අක්කා වෛද්‍ය පීඨයට තේරුණ බව ඇසූ තාත්තාගේ <u>හිසේ මලක් පිපුණි.</u>

(i) පුදුමයට පත් විය. (ii) හිසේ සැරසිල්ලක් කරන්නට විය.

(iii) දැඩි සතුටක් ඇති විය. (iv) හිසේ බර ගතියක් ඇති විය.

02 ඩිංගිරාලගේ ක්‍රියා දුටු එතනහාමිනේ <u>කුනිස්සන්ට දූල් දානවා</u> වගේ වැඩ කරන බව පවසමින් දොස් කීවා ය.

(i) නිතර කුනිස්සන් ඇල්ලීමේ යෙදෙයි. (ii) නිෂ්ඵල ක්‍රියාවල යෙදෙයි.

(iii) විශ්වාසවන්තව කටයුතුවල යෙදෙයි. (iv) ඉතා සුළු කටයුතුවල යෙදෙයි.

- **අංක 03 හා 04 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පමණක් අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

03 (i) මිශුන, සම්මන්ත්‍රණ, ශ්‍රේණිය (ii) විශේෂණ, උෂ්න, ප්‍රශ්න

(iii) පරිසණකය, ගණකාධිකාරි, දෙරන (iv) විමර්ශන, පරීක්ෂණ, කළමනාකරණ

04 (i) දූෂණ, නිෂ්පාදන, රක්ෂණ (ii) අක්ෂිදාන, නිෂ්ඵල, සමස්ථ

(iii) පුස්තකාල, ප්‍රතිපල, අක්ෂරය (iv) ප්‍රදර්ශන, පරන, තීක්ෂණ

05 නිවැරදි අකාරාදි පිළිවෙළට යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) විරාගය, ගම්පෙරළිය, යුගාන්තය, කලියුගය (ii) කුරුණෑගල, කුලියාපිටිය, පුත්තලම, මහව

(iii) වලහා, සිංහයා, කොටියා, මුගටියා (iv) හංසයා, පරවියා, සැළලිහිණියා, ගිරවා

06 බහ්වර්ථ පද පමණක් ඇතුළත් පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කුසුම, පුෂ්පය, මල, කමල (ii) සක්, ශක්‍ර, යහපත්, හක්ගෙඩිය

(iii) වත, මුහුණ, තොරතුරු, වස්ත්‍ර (iv) දද, කොඩි, මෝඩ, ජනයා

- **අංක 07 හා 08 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ ව්‍යාකරණ රීතිය දැක්වෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

07 ''වහසි බස් <u>නොදොඩව</u>, වනචරය. තා හා තාගේ මේ වැදි සෙනඟ එක හී පහරින් සුනු විසුනු කර දමමි.''

(i) පූර්ව ක්‍රියා පදයකි. (ii) අසම්භාව්‍ය ක්‍රියාවකි.

(iii) නාම විශේෂණ පදයකි. (iv) විධි ක්‍රියා පදයකි.

08 සුරවර <u>සැරදු</u> විබිසණ දෙව් කැළණි පුර

(i) ආශිර්වාද ක්‍රියා (ii) විධි ක්‍රියා

(iii) පූර්ව ක්‍රියා (iv) අසම්භාව්‍ය ක්‍රියා

- **අංක 09 හා 10 ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

09 ජාති නාමයකි

(i) පොත් (ii) මිනිස් (iii) මෝඩ (iv) දුටුගැමුණු

10 සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු වචනයකි.

(i) ලඹය (ii) සුවඳ (iii) එළුවා (iv) අඟල

11 මහාප්‍රාණ 'ඝ' සහ 'බ' අක්ෂරය යෙදුණු වචනය බැගින් ලියන්න.

(i) ........................................................................ (ii) ........................................................................

- **අංක 12 හා 13 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු ආඛ්‍යාත පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

12 නුඹලා පාසල් ........................................................ (ගියෙහි / ගියෙහු)

13 ඔවුහු තරගයෙන් ජය .......................................... (ලැබූහ / ලැබුවෙහු)

14 පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කර ලියන්න.

(i) සුබ නම් දොරටු පාලකයාට ........................................................ වගේ.

(ii) ඉත්තෑවාගේ ගෙට ........................................................ රිංගුවා වගේ.

15 පහත සඳහන් පද සඳහා සමානාර්ථවත් පදය බැගින් ලියන්න.

(i) උදුළ - ........................................................ (ii) චතුර - ........................................................

16 පහත සඳහන් පද සඳහා උපසර්ග පද යොදා විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(i) වැරදි - ........................................................ (ii) පැහැ - ........................................................

17 පහත සඳහන් පද සඳහා තනි පදය බැගින් ලියන්න.

(i) ජලයේ ගැඹුරුම ස්ථානය - ........................................................................................................

(ii) උඩගු බව නොමැති - ........................................................................................................

18 පහත සඳහන් උක්ත පද සඳහා අනුක්ත පද ලියන්න.

(i) ලේඛිකාවක් - ................................................ (ii) පුත්තු - ........................................................

19 පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.

(i) හයි - ........................................................ (ii) අකා - ........................................................

(iii) හැඳුණු -........................................................ (iv) ලට්ට - ........................................................

20 පහත සඳහන් තේරවිලි කවිය තෝරා ලියන්න.

ගමක නමකි අට අකුරෙන් යෙදෙන්නේ<br>
මෙලෙක තැනකි පද තුනකින් හැදෙන්නේ<br>
මුලට රජෙකි අග නිවසකි සඟුන්නේ<br>
කිමෙක මෙසක කිව හැකි දැයි බලන්නේ

........................................................................................................ (ලකුණු 2 x 20 = 40)

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුගුණ අලංකාරය කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස හඳුන්වන යුගය සඳහන් කරන්න.

(iii) පහත සඳහන් කවි දෙපදය අදාළ නාට්‍යයේ නම සඳහන් කරන්න.

එගොඩ මෙගොඩ ගම වට කළ පට්ටන්දර නැවතුණා
ඉහළ පහළ සිත වට කොට මල් යායක් පීදුණා

(iv) පහත සඳහන් පද දෙකෙහි අර්ථය ලියන්න.

(අ) ඉන්ද්‍රබීලයක් (ආ) රුපුනොද

(v) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.

කෙළියට කඩක් සඟවා යහළුවකු ගෙනේ
එළිකොට නැවත දුන් මිනිසෙකුට එතෙකිනේ
..............................................................................................
.............................................................................................. (ලකුණු 2 x 5 = 10)

02 පහත සඳහන් මාතෘකා අතුරින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) මරු කැඳවන රිය අනතුරු

(ii) මත් උවදුර පිටු දකිමු

(iii) වන සම්පත සුරකිමු

(iv) පොත් කියවීමේ අගය

(v) මම අඟහරු ලොවට ගියෙමි (ලකුණු 20)

03 ඔබේ පාසලේ සාහිත්‍ය සමිතියේ ලේකම් ඔබ යැයි සිතා එමගින් පවත්වනු ලබන සිසු නිර්මාණ ප්‍රදර්ශනය විවෘත කිරීම සඳහා ආරාධනා කරමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන රාජකාරි ලිපිය ලියන්න. (දිනය, වේලාව, අභිමත පරිදි යොදා ගන්න.) (ලකුණු 10)

04 පහතසඳහන් ප්‍රකාශ කීවේ කවුද? කා හටද? යන්න වෙන වෙනම සඳහන් කරන්න.

(i) ''ඒ අයට ඉංගිරීසි ආණ්ඩුවේ අනුග්‍රහයත් තියෙනවා නේද?''

(ii) ''අනේ බුදු ගම හාමුදුරුවනේ මගේ අතේ නම් දෝසයක් නෑ''

(iii) ඔබ දැනටමත් මට ප්‍රත්‍යුපකාර කර අවසන්. මම ගැයූ පළමු දිනයේ දීම ඔබේ ඇස්වල ගැලූ කඳුළු මට හොඳට මතක යි.''

(iv) ''පලයන් යන්න.... පොඞ්ඩක් පත්තරේවත් බලන්න නැහැ.''

(v) ''හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුළුවන් ද?'' (ලකුණු 2 x 5 = 10)

05 පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා ගෙන වාක්‍ය සම්පූර්ණ කර ලියන්න.

(i) දෙමාපියෝ දිවි හිමියෙන් ..................................................... ආරක්ෂා කරති. (දරුවෝ / දරුවන්)

(ii) මව කුඩා .......................................................................... වඩා ගත්තා ය. (දූරියක් / දූරියක)

(iii) .......................................................................................... දෙවියන් පුදති. (බැතිමත්හු / බැතිමතුන්)

(iv) ගොවියා ........................................................................................ ගාලට රැගෙන යයි. (ගවයෝ / ගවයින්)

(v) ඔබ දක්ෂයෙක් ........................................................................ (වන්නෙහි / වන්නේ ය)

(vi) සැඳෑවේ ........................................................................................ පරවෙති. (පද්මයෝ / පද්මයන්)

(vii) දද පෙළ පුරය .............................................................................. (සරසයි / සරසති)

(viii) ........................................................................................................ වාහන නතර කළහ. (රියදුරන් / රියදුරෝ)

(ix) කම්කරුවා වේගයෙන් වැඩ ................................................... (කරයි / කරති)

(x) සතුරෝ ................................................. (වැනසේවා ! / වැනසෙත්වා !) (ලකුණු 1 x 10 = 10)

06 (i) පහත සඳහන් ක්‍රියා පද සඳහා සුදුසු උක්ත පද යොදමින් වාක්‍ය බැගින් ලියන්න.

(අ) දෙනු මැනවි (ආ) දෙත්වා !

(ii) පහත සඳහන් පද දෙකෙහි තද්ධිත නාමය හා ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(අ) ලෝහමය (ආ) දේශීය

(iii) පහත සඳහන් කොටසෙහි ඉරි ගසා ඇති අක්ෂරවලට යොදා ඇති පිල්ලම් නම් කරන්න.

සමන් පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
වගෙයි අහස අන්න බලනු
කොච්චර ලස්සනද රැට

(iv) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි විසින් රචනා කරන ලද දේශාභිමානි පද්‍ය කෘති දෙකක් සඳහන් කරන්න.

(v) පහත සඳහන් කවිය සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

ඔවදන් දී මනා
රකී දෑස මෙනා
..............................................................
.............................................................. (ලකුණු 2 x 5 = 10)

07 පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දේවාලයෙහි ඇතුළු ගබඩාවට පිවිසෙන දොරටුවෙහි බිත්ති දෙකකින් වට වූ ස්ථානයක් වෙයි. වට්ටාරම නමින් හඳුන්වන එම ස්ථාන 'ආලත්ති අම්මලා' යනුවෙන් හඳුන්වන කාන්තාවන් විසින් ආලත්ති පූජාව පවත්වනු ලැබේ. ගබඩාවට ඇතුළු වන ස්ථානයේ පැරණි ගෘහ නිර්මාණ අංගයක් වන කොරවක්ගල දක්නට ලැබේ. කතරගම දෙවියන්ගේ රූපය සිතුවම් කරන ලද තිරයකින් දේවාලයේ දොරටුව ආවරණය වෙයි.

දේවාලයේ දිවා රෑ ආරක්ෂාව සඳහා තේවාකාරයෝ 18 දෙනෙක් ද කපුරාලලා 12 දෙනෙක් ද ආලත්ති පූජා සඳහා කාන්තාවෝ 24 දෙනෙක් ද දේවාලයට ඇත්ගොව්වෝ 4 දෙනෙක් ද අය බදු ගැනීම සඳහා මොහොට්ටි ලේකම් කෙනෙක් ද දෙවියන්ට යාඥා කිරීම සඳහා හා වියවුල් බේරීමට එක් කෙනෙක් ද පෙරහැර සංචාරයේ දී අවුල් වළක්වා ගැනිමට නිලමේවරු එක් කෙනෙක් ද දෙවියන් වැඩමවීම සඳහා බස්නායක නිලමේ කෙනෙක් ද ආදී වශයෙන් තේවා කරුවෝ සේවයේ යෙදී සිටිති. මෙම තේවා කරුවන්ට නියමිත දේවකාරි කටයුතු තල්පතක ලියා දේවාලයේ ලේකම් (ලේඛන) සාදවා ඇත.

(i) 'ආලත්ති පූජාව' පවත්වනු ලබන්නේ කවුරුන් විසින්ද?

(ii) මෙහි සඳහන් පැරණි ගෘහ නිර්මාණ අංගය කුමක්ද?

(iii) ඡේදයේ සඳහන් පරිදි බස්නායක නිලමේතුමාගේ කාර්ය කුමක්ද?

(iv) තේවා කරුවන්ට අදාළ දේවකාරි කටයුතු ලියා ඇත්තේ කුමකද?

(v) ඡේදයේ විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇත. එය සඳහන් කරන්න. (ලකුණු 2 x 5 = 10)

# Sinhala 3rd term Online Class Paper No - 05

**8 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය**

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | iii | (02) | ii | (03) | iv | (04) | i | (05) | ii | (06) | iii |
| (07) | iv | (08) | i | (09) | ii | (10) | iii | | | | |

(11) නිවැරදි වචන සඳහා ලකුණු ලබා දෙන්න. (12) ගියෙහු (13) ලැබූහ

(14) i. ඔටුනු පැලැන්දුවා ii. කබල්ලෑවා

(15) i. දිලිසෙන, දීප්තිමත්, බබළන ii. දක්ෂ, බුහුටි, සමත්, සමර්ථ, හපන්

(16) i. නිවැරදි ii. අවපැහැ (17) i. දියඹ ii. නිහතමානි

(18) i. ලේඛිකාව ii. පුතුන්

(19) i. හත්තිය ii. මකා iii. වැඩුණු iv. ලොට්ට

(20) තිස්සමහාරාමය (ලකුණු 2 x 20 = 40)

**II කොටස**

01. (i) වීදාගම මෛත්‍රී හිමි (ii) කෝට්ටේ යුගය (iii) පරාඝ්ස
(iv) (අ) නොසෙල්වෙන ශක්තිමත් කණුවක් (ආ) සතුරන්ගේ තේජස
(v) විළි වැස්මක් නො ම විය දෙවි වුවත් අනේ
කෙළියටවත් නොකරවු සොරකමක් දනේ (ලකුණු 2 x 5 = 10)

02. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 20 යි.)

03. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 10 යි.)

04. (i) දායක මහතා - ගුණානන්ද හිමියන්ට
(ii) පූර්ණක - පුංචිරාලට
(iii) පුංචි කිරිල්ලිය - අධිරාජ්‍යයාට
(iv) පත්තරේ බලමින් සිටි මිනිසා - පියසේනට
(v) ඉස්කෝලේ මහත්තයා - මුදලි හාමිට (ලකුණු 2 x 5 = 10)

05 (i) දරුවන් (ii) දූරියක (iii) බැතිමත්හු (iv) ගවයින් (v) වන්නෙහි
(vi) පද්මයෝ (vii) සරසයි (viii) රියදුරෝ (ix) කරයි (x) වැනසෙත්වා
(ලකුණු 1 x 10 = 10)

06 (i) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.
(ii) (අ) ලෝහ + මය (ආ) දේශ + ඊය
(iii) (i) පාපිල්ල (ii) දීර්ඝ ඇදය
(iv) නිදහසේ මන්ත්‍රය / ලංකා මාතා / දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල / නිදහසේ දැහැන
(v) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 2 x 5 = 10)

07 (i) ආලන්ති අම්මලා (ii) කොරවක් ගල (iii) දෙවියන් වැඩම වීම
(iv) තල්පතක (v) දිවා - රෑ (ලකුණු 2 x 5 = 10)